ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2492/06 - 2026 ජූනි මස 08 වැනි සඳුදා - 2026.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2001 (iv)

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු, ඒ පනතේ 105 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

සභාපති
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව.

2026 ජූනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

රීති

2024 සැප්තැම්බර් මස 09 වන දින අංක 2401/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා වන අතිරේක අවශ්‍යතා රීති, එම රීතිවල 3 වන රීතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"3. ප්‍රතිරක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා තැරැව්කරුවකු වශයෙන් පනත යටතේ ලියාපදිංචිවීමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු විසින් -

(අ) වරලත් රක්ෂණ ආයතනයේ (ඒ. සී. අයි. අයි.) ආශ්‍රිත සාමාජිකයකුගේ සුදුසුකම් හෝ ඉන්දියානු රක්ෂණ ආයතනයේ (ඒ.අයි.අයි.අයි.) ආශ්‍රිත සාමාජිකයකුගේ සුදුසුකම් හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන්

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන සුදුසුකමක් සමඟ ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවක අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද සහිතව රක්ෂණ සමාගමක හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක රක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහක පළපුරුද්ද; හෝ

(ආ) කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද සමග ප්‍රතිරක්ෂණ ක්ෂේත්‍රයේ වසර දහයක පළපුරුද්ද,

සහිත අවම වශයෙන් එක් තැනැත්තකු හෝ සේවානියුක්ත කර තබා ගත යුතු අතර, ඒ තැනැත්තා ප්‍රධාන නිලධරයකු පත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පනවන ලද වෙනත් යම් නියමයන්ට යටත්ව, ඒ තැරැව්කාර සමාගමේ ප්‍රධාන නිලධරයාගේ තනතුර ඇතුළත්ව, ජ්‍යෙෂඨ කළමනාකරණ තනතුරක් දරනු ලැබිය හැකි ය.”.

EOG 06 - 0061